Sinhalese(සිංහල)

# භාෂණ පරිවර්තකයන්

ඔබට හෝ ඔබේ පවුලේ අයට ඉංග්‍රීසියෙන් අදහස් හුවමාරු කර ගැනීමට අපහසු නම් හෝ ඔබ AUSLAN භාවිත කරන්නේ නම් ඔබ නොමිලේ සැපයෙන වෘත්තීමය භාෂණ පරිවර්තකයෙකුගේ සේවය ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

භාෂණ පරිවර්තනය සඳහා පවුලේ අය, හිතමිතුරන් හෝ ද්විභාෂික කාර්ය මණ්ඩලය යොදා ගැනීම අනුචිත වන අතර එය Monash Health ප්‍රතිපත්තිවලට ද පටහැනිය.

අපගේ භාෂණ පරිවර්තකයන්ගේ වෘත්තීයව NAATI (පරිවර්තකයන් හා භාෂණ පරිවර්තකයන් වෙනුවෙන් වන වරලත් අධිකාරිය) වෙතින් වර ලබා ඇති අතර පාර්ශ්ව දෙකට ම ස්වාධීන, අපක්ෂපාතී, විශ්වසනීය, රහසිගත, පරිපූර්ණ හා නිරවද්‍ය සේවයක් ලබා දීමට ඔවුන් වෛද්‍යමය හා නෛතික වගකීමක් පවතියි.

භාෂා හා උපභාෂා 29ක් ආවරණය කරන 70 දෙනෙකුගෙන් යුතු භාෂණ පරිවර්තන කණ්ඩායමක් අප සතුව පවතියි. එයට පහත දැක්වෙන භාෂා අදාළ: අරාබි, බොස්නියානු, බුරුම, කැන්ටන්, ක්‍රොඒෂියානු, දාරි, ෆාර්සි, ග්‍රීක්, හක්කා චීන්, හසරගි, හින්දි, ඉතාලි, කෙමීර්, කොරියානු, මැලේ, මැන්ඩරින්, පෂ්තු, සර්බියන්, ෂැන්ග්හයිනීස්, සිෂුවාන්, සිංහල, ස්පාඤ්ඤ, රුසියානු, දෙමළ, ටෙඕ චිව්, තුර්කි, උර්දු හා වියට්නාම්

අපගේ කණ්ඩායම විසින් ආවරණය නොකරන භාෂා සඳහා අපි බාහිර ආයතනවල භාෂණ පරිවර්තකයන් යොදා ගන්නෙමු.

**අප පිරිනමන සේවා**

අප සේවා ස්ථානවල දී සතියේ දින 7 පැය 24 පුරා ම පහත දැක්වෙන සේවා සපයනු ලැබේ:

- ආදාළ ස්ථානයේ දී සැපයෙන භාෂණ පරිවර්තකයන්
- වීඩියෝ (ටෙලිහෙල්ත්) භාෂණ පරිවර්තකයන්
- දුරකථන ඔස්සේ සේවය සපයන භාෂණ පරිවර්තකයන්

පහත දැක්වෙන අවස්ථාවල දී භාෂණ පරිවර්තකයන් භාවිත කිරීම විශේෂයෙන් ම වැදගත් වේ:

- ඔබට හා ඔබේ පවුලේ අයට ඔබේ හිමිකම් හා වගකීම් ගැන තොරතුරු ලබා දෙන විට
- ඔබේ ජීවිතය සම්බන්ධයෙන් ඔබ හා ඔබේ පවුලේ අයට වැදගත් තීරණ ගැනීමට ඇති අවස්ථාවල දී
- තීරණ ගැනීම සම්බන්ධයෙන් ඔබට හෝ ඔබේ පවුලේ අයට අත්‍යවශ්‍ය තොරතුරු ලබා ගැනීම අවශ්‍ය වන විට.
- ඔබ හා ඔබේ පවුලේ අය අවබෝධය සහිතව අනුමැතිය ලබා දෙන ලියවිලි අත්සන් කරන අවස්ථාවල
- ඔබට හෝ ඔබේ පවුලේ අයට සපයන ලද තොරතුරු අවබෝධ කර ගැනීමට නොහැකි අවස්ථාවල දී You or your family are unable to read or understand information provided to you

ඔබට වෙන්කර ගත් හමුවීමකට පැමිණිය නොහැකි නම්, විශේෂයෙන් ම භාෂණ පරිවර්තකයෙකු වෙන් කර ඇත්නම්, පැමිණිය නොහැකි බව අප වෙත දැන්වීම ඔබේ වගකීමයි.

**භාෂණ පරිවර්තකයෙකු ලබා ගැනීම**

කාර්ය මණ්ඩලය විසින් ඔබට භාෂාණ පරිවර්තකයෙකු අවශ්‍ය බව හඳුනාගෙන ඔබ වෙනුවෙන් වෙන් කිරීම සිදු කරනු ඇත. එසේ වුවත් එය සිදු නොවුව හොත් ඔබේ රැකවරණයේ ඕනෑම අවස්ථාවක උපකාර ඉල්ලා සිටීමට නොපැකිලෙන්න.

**ප්‍රයෝජනවත් සබැඳි**

- COVID-19 Translated Resources (කෝවිඩ් 19 පරිවර්තිත සම්පත්)
- Right and Responsibilities information (හිමිකම් හා වගකීම් පිළිබඳ තොරතුරු)
- Translated health information – Health Translations VIC (පරිවර්තිත සෞඛ්‍ය තොරතුරු - සෞඛ්‍ය පරිවර්තන VIC)

**අප අමතන්න**

**(03) 9594 2375 / (03) 9554 8860**

**monashinterpreters@monashhealth.org / dandenonginterpreters@monashhealth.org**